# <u>දැන්වීමයි</u>

## <u>මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2023/2024</u>

2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රවේශිත මහපොළ ශිෂ්‍යත්ව ලාභී සිසුන් මහපොළ ශිෂ්‍යත්වය සඳහා **<u>2025.06.30 දිනට ප්‍රථම</u>** ලියාපදිංචි විය යුතු අතර එය පහත සඳහන් පරිදි සිදු කල යුතු බව කරුණාවෙන් සලකන්න.

- මහපොළ ශිෂ්‍යත්ව ලියාපදිංචිය සඳහා වන ආකෘති පත්‍රය <u>www.mahapola.lk</u> මහපොළ වෙබ් අඩවියට පිවිස සිය ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කර භාගත කොට, සම්පූර්ණ කරන ලද ලියාපදිංචි අයදුම්පත සෘජුවම (Online) මහපොළ අරමුදල වෙත **<u>2025.06.30 දිනට පෙර</u>** යොමු කල යුතුය.

- ශිෂ්‍යත්ව වාරික මුදල් බැර කිරීම සඳහා වන <u>ගිණුම් අංකය ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ පමණක් ම විය යුතුය.(බද්ධ ගිණුම් අංක භාර ගනු නොලැබේ)</u>

- Online මගින් යොමු කරන ලද මහපොළ ශිෂ්‍යත්ව ලියාපදිංචි ආකෘති පත්‍රයේ පිටපතක් ශිෂ්‍යත්වලාභියාගේ අත්සන සහිතව <u>නොපමාව</u> ශ්‍රී පාලි මණ්ඩපයේ ශිෂ්‍ය සුභසාධන අංශය වෙත බාර දිය යුතුය. (ශිෂ්‍යත්ව වාරික මුදල් බැර කිරීම සඳහා ඔබ විසින් ලබා දෙන බැංකු ගිණුමට අදාල පාස්පොතෙහි පැහැදිලි ඡායා පිටපතක් හෝ බැංකුව මගින් නිකුත් කරන ලද ගිණුම් අංකය සඳහන් ලිපියේ පැහැදිලි ඡායා පිටපතක් ද මෙම ආකෘති පත්‍රය සමග බාර දිය යුතුය.)

- ඔබ විසින් ලබා දෙන බැංකු ගිණුම් අංකය ඉදිරියේදී වෙනස් නොකරන ලෙසත්, වෙනස් කරනු ලබන ගිණුම් අංක හිමි සිසුන්ගේ ගෙවීම් අත්හිටුවන බවත් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් දැනුම් දී ඇත.

- මහපොළ ශිෂ්‍යත්වය හිමි සිසු  ගේ නාම ලේඛණය ප්‍රදර්ශනය කල දිනයේ සිට මාස 03ක් ඇතුලත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මහපොළ ශිෂ්‍යත්ව සම්බන්ධ අභියාචනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කල යුතුබව කරුණාවෙන් දන්වමි.


ආර්.එම්.සී.එම්.බණ්ඩාර
සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධන


2025.06.24

CS CamScanner